www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
## ஆண்டிறுதி மதிப்பீடு - 2019
## Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 08 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-.............................................. විභාග අංකය:-..............................................

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.

01. වෙනත් දේව වන්දනාත්මක ක්‍රියා ලෙස සැලකෙන්නේ,
    1. සැදැහැවතුන්ට දේව ප්‍රසාද නිධාන දානය කිරීම ය.
    2. ආශිර්වාද කිරීම්, පදක්කම් පැළඳවීම්, ශුද්ධ ධාතුවලට ගරු කිරීම් යනාදිය ය.
    3. දිව්‍ය පූජාවලට සහභාගි වීමය.
    4. පෞද්ගලික හා සාමූහිකව යාච්ඤා කිරීම ය.

02. දිව්‍ය පූජාවේ ආරම්භක පිළිවෙත, දේව වාක්‍ය පිළිවෙත, පුදසුන සූදානම් කිරීමේ පිළිවෙත, ස්තෝත්‍ර යාගික යැදුම හා සම්බන්ධිත යාච්ඤා පිළිවෙලින් වන්නේ,
    1. මහා සාධුකාරය, පඬුරු මත යැදුම, සුපුවත් ජය නද, සුරදූත ගීය
    2. සුරදූත ගීය, සුපුවත් ජය නද, පඬුරු මත යැදුම, මහා සාධුකාරය
    3. පඬුරු මත යැදුම, සුපුවත් ජය නද, සුරදූත ගීය, මහා සාධුකාරය
    4. සුපුවත් ජය නද, සුරදූත යැදුම, මහා සාධුකාරය, පඬුරු මත යැදුම

03. දේවස්ථානයේ වාර්ෂික මංගල්‍යයට පෙරදින පැවැත්වෙන්නේ,
    1. පශ්චත්තාපික පිළිවෙතකි.
    2. රෝගීන් ආසිරි ගැන්වීමේ දේව මෙහෙයකි.
    3. මීසමේ නැසීගිය අය උදෙසා පිදෙන දිව්‍ය යාගයකි.
    4. සන්ධ්‍යා යාම යැදුමකි.

04. ක්‍රිස්තු දේහය, ක්‍රිස්තුන් වහන්සේ තුළින් පියාණන් වහන්සේ පුදන පූර්ණ ප්‍රසිද්ධ වන්දනාව
    1. කල්වාරි යාගය
    2. දිව්‍ය සත් ප්‍රසාද වන්දනාව
    3. ජන වන්දනාව
    4. ත්‍රිත්වික නමස්කාරය

05. සමිඳුන්ගේ ජය මංගල දිනය ශුද්ධ ලෙස ගත කරමින් ස්වාමීන් වහන්සේ තුළ ප්‍රීතිය අත්දකින්නට විශේෂාකාරව අප යොමු වන්නේ,
    1. නත්තල් මංගල්‍යය දින
    2. මීසමේ වාර්ෂික මංගල්‍යය දින
    3. ඉරු දින
    4. ආලේලූයියා සෙනසුරාදා

06. දෙවියන් වහන්සේට ප්‍රසන්න අමතර යමක් කරන්නට ස්වකීය කැමැත්තෙන් ම දෙන පොරොන්දුව
    1. දිවුරුමකි.
    2. බාරයකි.
    3. දයාවේ ක්‍රියාවකි.
    4. ගිවිසුමකි.

07. සාන්තුවරයනට අප ගරු කළ යුත්තේ,
    1. එතුමන්ලාගේ ආදර්ශමත් දිවිය උදෙසා ය.
    2. එතුමන්ලාගේ රූපවලට ප්‍රාතිහාර්ය පෑමේ බලය ඇති නිසා ය.
    3. එතුමන්ලා, දෙවිඳුන් හා සමාන නිසා ය.
    4. එතුමන්ලා කෙරෙහි ඇති ඇදහිල්ල නිසා ය.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

08. පළමු වන පනතට විරුද්ධ ක්‍රියාවකි.
1. ඉරු දින දිව්‍ය පූජාව අතපසු කිරීම
2. දෙවිඳුන් නමින් දිවුරුම් දීම
3. මිත්‍යා ඇදහිලි මත යැදීම
4. අනුන්ට හිරිහැර කිරීම

09. ත්‍රිත්ව ෛක දෙවියන් වහන්සේට අපගේ විශ්වාසය පුද කරන්නේ,
1. දස පනතෙන්
2. ප්‍රසාද ස්නාපන පොරොන්දුවලින්
3. ස්වාමිවාක් ආරාධනාවෙන්
4. ආගමික වත්පිළිවෙත් ඉටු කිරීමෙන්

10. "ශුද්ධාත්මයාණන්ගේ මුද්‍රාව ලබා ගන්නැ"යි පවසමින් දානය කරන ප්‍රසාද නිධානය
1. ප්‍රසාද ස්නාපනය
2. අභිවෘද්ධි ආලේපය
3. පූජකවරය
4. රෝගීන්ගේ ආලේපය

11. මෙලොව වෙනුවට ස්වර්ගීය වස්තුව හා සැප සම්පත්වලට ඇලුම් කිරීමට අයත් වන ශුද්ධාත්ම දීමනාව වන්නේ,
1. තේරුම් ගැනීම.
2. දේව භය
3. දේව භක්තිය
4. ප්‍රඥාව

12. ආත්මානුභාවය, දේවාත්මානුභාවය, ශුද්ධාත්මය යන යෙදුම් පුරාණ ගිවිසුමේ භාවිතා කර ඇත්තේ,
1. දෙවි පියාණන් වහන්සේ හැඳින්වීමට
2. ශුද්ධාත්මයාණන් වහන්සේ හැඳින්වීමට
3. ජේසුස් වහන්සේ හැඳින්වීමට
4. දිවැසිවරුන් හැඳින්වීමට

13. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික සූදානම යනුවෙන් අදහස් කරන්නේ,
1. පාපයෙන් තොර වීමය.
2. පැයකට පෙර ආහාර පානයෙන් වැළකීමය.
3. සම්පූර්ණ දිව්‍ය පූජාවට සහභාගි වීමට ය.
4. විරුද්ධවාදීන්ට සමාව දීමය.

14. ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය
1. දෙව්මැදුර
2. දිව්‍ය සත්ප්‍රසාදය
3. ශුද්ධ බයිබලය
4. කිතුනු පවුල

15. අපගේ ජීවිතවල ප්‍රාතිහාර්ය අත්දැකීමට අවශ්‍ය වන්නේ,
1. ආත්මීය භක්ති අභ්‍යාස
2. සාන්තුවර භක්තිය
3. නිරාහාරශීල ඒකීම.
4. දේව විශ්වාසය

16. ජේසුස් වහන්සේගේ ධර්මදූත සේවාව තුළ පව්කරුවන්ට දයාව දක්වූ බව ලූක් තුමා පෙන්වා දෙන නිසා, ලූක් ශුභාරංචිය මෙලෙස හඳුන්වයි.
1. අන්‍ය ජාතිකයන්ගේ ශුභාරංචිය
2. දයාවේ ශුභාරාංචිය
3. දිළින්දන්ගේ ශුභාරංචිය
4. කොන්වූවන්ගේ ශුභාරංචිය

17. A - වපුරන්නාගේ උපමාව
B - නිධානය පිළිබඳ උපමාව
C - අබ ඇටය පිළිබඳ උපමාව
D - මුතු ඇටය පිළිබඳ උපමාව
දේව රාජ්‍යයේ වැදගත්කම ලොවට ප්‍රකාශ කිරීම සඳහා අදාළ උපමා වන්නේ,
1. B හා D
2. A හා B
3. C හා D
4. A හා C

18. දාවිත් රජ පරපුරෙන් ගැළවුම්කරුවාණන් පැමිණෙන බව ප්‍රකාශ කළේ දිවැසිවර
1. මීකා
2. යෙසායා
3. නාතාන්
4. ජෙරමියා

19. "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ" යන විශ්ව ලේඛණය රචනා කරන ලද්දේ,
1. අති උතුම් දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
2. අති උතුම් xxiii වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා
3. අති උතුම් xii වන පියුස් ශුද්ධෝත්තම පියතුමා
4. අති උතුම් I වන ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

20. බෞතිස්ම ස්නාපනයෙන් පසු ජේසුන් වහන්සේ ගියේ,
1. ජෙරුසලමට
2. නාසරෙත් ග්‍රාමයට
3. ගලීලයට
4. පාළුකරයට

(ලකුණු 2 × 20 = 40)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.

(01) (i) 1,2 දේව පනත් නම් කරන්න.

(ii) ශුද්ධ ලියවිල්ලට අනුව ඉරු දින සිදු වූ විශේෂ සිදුවීම් 2ක් ලියන්න.

(iii) කතෝලික විශ්වාසයට අනුව වැළකිය යුතු මිත්‍යා ඇදහිලි 2ක් නම් කරන්න.

(iv) දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් 2 නම් කරන්න. (ලකුණු 4 X 4 = 16)

(02) (i) ශුද්ධ වූ ත්‍රිත්වය නම් කරන්න.

(ii) ශුද්ධ වූ ත්‍රිත්වයේ එකිනෙක වහන්සේලාට පැවරී ඇති කාර්යයන් අනුපිළිවෙළින් දක්වන්න.

(iii) පවුල තුළ ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ ආදරය ප්‍රකාශ කළ හැකි ආකාර 6ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6= 11)

(03) (i) "ජන වන්දනාව" කෙටියෙන් හඳුන්වන්න. (වාක්‍යයකින්)

(ii) ජන වන්දනාවේ ප්‍රධාන අංග 3 නම් කරන්න.

(iii) ඉරුදින දිව්‍ය පූජා මෙහෙයට අර්ථවත්ව සහභාගී වීමට ඔබට කළ හැකි දේවල් 6ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6= 11)

(04) (i) 'දේව රාජ්‍යය' වාක්‍ය දෙකකින් හඳුන්වන්න.

(ii) දේව රාජ්‍යයේ වටිනාකම් 3ක් නම් කරන්න.

(iii) ඔබේ ජීවිතයට ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආලෝකය පතමින් යාච්ඤාවක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6= 11)

(05) (i) දිව්‍ය සත්ප්‍රසාදය යනු කුමක් ද?

(ii) ජේසුස් වහන්සේගෙන් කරුණාව ලැබූ පුද්ගලයන් තිදෙනෙකු නම් කරන්න.

(iii) දිව්‍ය සත්ප්‍රසාදිය ජේසුස් වහන්සේට ඔබ ප්‍රේමය ප්‍රකාශ කරන ආකාර 6ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6= 11)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(06) (i) ඔබ දන්නා සාන්තුවරයන් දෙදෙනෙකු නම් කරන්න.

(ii) ජේසුස් වහන්සේ හමුවීමෙන් පසු ජීවිතය වෙනස් කරගත් පුද්ගලයන් තිදෙනෙකු නම් කරන්න.

(iii) ඔබගේ ආත්මික ජීවිතය වර්ධනය කර ගැනීමට ඔබ ගන්නා පියවර 6ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6= 11)

(07) (i) ලූක් ශුභාරංචි හඳුන්වන විවිධ නම් 2ක් ලියන්න.

(ii) ජේසුස් වහන්සේ පහත ස්ථානවල දී සිදු කළ සේවාවක් බැගින් ලියන්න.

(අ) ජෙරුසලම

(ආ) නායින්

(ඉ) කානා

(iii) ස්නාවක ජුවාම්තුමාගේ ජීවිතයෙන් ඔබේ ජීවිතයට ගත හැකි ආදර්ශ 6ක් ලියන්න.

(ලකුණු 2 + 3 + 6= 11)

Agaram.LK - Keep your dreams alive!
agaram.lk
Agaram.LK - Keep your dreams alive!



agaram.lk